# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

# Ministry of Finance, Planning and Economic Development

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 120(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 393

பொது தொழில்முயற்சிகள் குழுவினால் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பாக நிலையியற் கட்டளை இல. 120(4) இன் கீழ் கௌரவ அமைச்சரால் எடுக்கப்பட்ட அவதானிப்புகள் மற்றும் நடவடிக்கைகளை முன்வைத்தல்.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இல. 393

Presenting the observations and action taken by the Honorable Minister under Standing Order No. 120(4) regarding the reports tabled by the Committee on Public Enterprises in Parliament

Parliamentary Series No. 393

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 393

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இல. 393

Parliamentary Series No. 393

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

Ministry of Finance, Planning and Economic Development

# පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 393

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දසවැනි පාර්ලිමේන්තුව

( පළමු වැනි සභාවාරය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ  හත්වැනි වාර්තාව

(මහපොළ භාරකාර අරමුදල විසින් **2022** හා **2023** වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තා හා එහි වර්තමාන කාර්ය සාධනය සම්බන්ධයෙන් **2025.07.09** දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී සාකච්ඡා කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති වාර්තාවට අදාළ භාණ්ඩාගාරයේ නිරීක්ෂණ)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හත්වැනි වාර්තාව

මහපොළ භාරකාර අරමුදල විසින් 2022 හා 2023 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තා හා එහි වර්තමාන කාර්ය සාධනය සම්බන්ධයෙන් 2025.07.09 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී සාකච්ඡා කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති වාර්තාවට අදාළ භාණ්ඩාගාරයේ නිරීක්ෂණ

| සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ |
|---|---|---|
| 1.3 **භාරකාර මණ්ඩල රැස්වීම**<br>භාරකාර මණ්ඩල රැස්වීම් සංගතතාවයකින් පවත්වා නොතිබූ අතර එසේම ඇතැම් වර්ෂවල භාරකාර මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබිණි. | i. භාරකාර මණ්ඩල රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් සුදුසු පරිදි මාර්ගෝපදේශ සකස් කිරීම. | • මේ වනවිට විධිමත් පරිදි මාසික රැස්වීම් පැවැත්වීමට පියවර ගෙන ඇති බව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් දන්වා ඇත. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මත පදනම්ව භාරකාර මණ්ඩලයට අදාලව මාර්ගෝපදේශ සකස් කරමින් පවතින බව වැඩිදුරටත් දන්වා ඇත. |
| 1.4. **විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම**<br>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට වරක් හෝ පැවැත්විය යුතු වුවත් මහපොළ භාරකාර අරමුදල විසින් 2022 සහ 2023 වර්ෂ සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එක බැගින් පවත්වා තිබුණු අතර, 2024 සහ 2025 වර්ෂවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබිණි. | i විගණන හා කළමනාකරණ කමිටු සක්‍රීය කිරීමට කටයුතු කිරීම.<br><br>ii. විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතීත්වය අත්‍යවශ්‍යම හා සුදුසුම පුද්ගලයා විසින් දරනු ලබන බවට වගබලා ගැනීම. | • 2025.12.22 දින සිට නව අභ්‍යන්තර විගණක පත් කිරීමත් සමගම 2025 අවසන් කාර්තුවේ විගණන රැස්වීම 2026.01.02 දින පැවැත් වූ බව දන්වා ඇත.<br>• විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති ලෙස අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වරයා පත් කර ඇති බව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් දන්වා ඇත. |
| 1.5 **සංයුක්ත සැලැස්ම හා උපායමාර්ගික සැලැස්ම**<br>මහපොළ භාරකාර අරමුදල විසින් 2024 - 2026 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් එය 2025 වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි. | i. වර්තමාන රජයේ ප්‍රතිපත්ති සමග අනුගතවන පරිදි උපායමාර්ගික සැලැස්ම යාවත්කාලීන කිරීම. | • 2025 දෙසැම්බර් මාසය වන විට ඉහළ කළමණාකාරීත්වයේ පුරප්පාඩු පිරවීමත් සමඟම උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම අරඹා ඇති අතර කඩිනමින් එය නිම කර ඉදිරිපත් කරන බව අමාත්‍යාංශය විසින් දන්වා ඇත. |

| | | |
|---|---|---|
| 1.6 **කාර්ය මණ්ඩල සංයුතිය**<br>ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 1ක්, මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 03ක්, කළමනාකරණ සහකාර තනතුරු 03ක් හා ප්‍රාථමික සේවක මට්ටමේ තනතුරු 02 ක් ඇතුලත්ව මුළු සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 09 ක් පැවතුණි. | i. මහපොළ භාරකාර අරමුදලේ කටයුතු නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීම මූලික ප්‍රමුඛතාවයක් ලෙස සලකා බඳවා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීම. | • ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 1ක්, මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 03ක්, සඳහා නිළධාරීන් බඳවා ගෙන ඇත. කළමනාකරණ සහකාර තනතුරු 03 සඳහා සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇත. ප්‍රාථමික සේවක මට්ටමේ තනතුරු 02 ක් සහ රියදුරු ඇබෑර්තුවක් සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් පත් කරන ලද සමාලෝචන කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇතිබව වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් දන්වා ඇත. |
| 1.7 **අභ්‍යන්තතර විගණක තනතුර පුරප්පාඩුව පැවතීම**<br>2022 අප්‍රේල් 04 වැනි දින පත්කර තිබූ අභ්‍යන්තර විගණක, 2023 ජූලි 30 දින සේවයෙන් ඉවත් වීමෙන් අනතුරුව, 2023 ඔක්තෝබර් 10 දින සිට වාණිජ දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී, වැඩබැලීමේ පදනම මත එම තනතුරට පත්කර තිබූ නමුත් එම නිලධාරියා ද 2024 අප්‍රේල් 30 දින ඉල්ලා අස්වීම හේතුවෙන්, එදින සිට අරමුදලේ අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී පැවතුණි. | i. මහපොළ භාරකාර අරමුදලේ කටයුතු නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීම මූලික ප්‍රමුඛතාවයක් ලෙස සලකා බඳවා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීම. | • 2025.12.22 දින සිට නව අභ්‍යන්තර විගණක පත් කර ඇති බව දන්වා ඇත. |
| **03**. **2021 ජනවාරි 8 වෙනි දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**<br><br>3.1 නිර්දේශ අංක 10 - මහපොළ භාරකාර අරමුදලේ පරිපාලිත සමාගම් අලාභ ලැබීම<br><br>සී/ස නැව් වෙල්ත් කෝපරේෂන් සමාගම<br>නැව් වෙල්ත් සෙකියුරිටීස් සමාගම | i. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ වෝහාරික විගණනයක් සිදුකර එහි නිර්දේශ මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට එම වාර්තාව ඉදිරිපත් කිරීම. | • අරමුදල සම්බන්ධයෙන් සිදු කරනු ලබන වෝහාරික විගණනයේ විෂය පථයට අරමුදලේ පරිපාලිත සමාගම් වල කටයුතු ද ඇතුලත් කර ඇති බැවින් අදාල වාර්තාව ලැබීමෙන් පසුව ඉදිරි කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වන බවත් වෝහාරික විගණනයට අදාල ලංසු ඇගයීමේ කටයුතු මේ වනවිටත් සිදු වෙමින් පවතින බවත් දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| 3.2 | නිර්දේශ අංක 11 - ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ අයිතිය | i. මෙම ආයතනය පෞද්ගලික අංශය සතු කිරීමේ වැඩපිළිවෙළ තුළ බරපතල වංචාවක් සිදු වී ඇති බැවින් පූර්ණ බලය සහිත කොමිසමක් පත් කොට මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීමත්, ඒ මඟින් අනාවරණය වන තොරතුරු මත පදනම්ව සිදුකර ඇති වංචාවට දඬුවම් ලබා දීමටත් කටයුතු කිරීම.<br>ii. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLITT) මහපොළ භාරකාර අරමුදලේ පරිපාලිත ආයතනයක් බවට නැවත පත් කිරීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.<br>iii. මෙම ආයතනය නැවත අරමුදලට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා ලබා දී ඇති නිර්දේශ පිළිබඳ නැවත සළකා බැලීම අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා කටයුතු කරන මෙන් නීතිපති දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් යොමු කිරීම.<br>iv මෙම ආයතනය පවරා දීම සම්බන්ධයෙන් වන තීරණය, නැවත සමාලෝචනය කිරීම අවශ්‍ය නම් අමාත්‍ය මණ්ඩල තීරණයක් මඟින් එය සිදු කිරීම සම්බන්ධව ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කිරීම හා ඒ පිළිබඳ වගකීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් දැරීම. | • අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් සිදු කරනු ලබන වෝහාරික විගණනයේ විෂය පථයට ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයට අදාලව 1999 සිට 2024 දක්වා පරික්ෂා කිරීමේ කටයුතු ඇතුලත් කර ඇති බවත් වෝහාරික විගණනයට අදාල ලංසු ඇගයීමේ කටයුතු මේ වනවිටත් සිදු වෙමින් පවතින බව දන්වා ඇත.<br>• මෙම ආයතනය නැවත රජයට පවරා ගැනීම රජයේ ප්‍රතිපත්ති තීරණයක් වන බැවින් ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට නියමිත බව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් දන්වා ඇත.<br>• නීතිපතිවරයා විසින් ප්‍රකාශ කර ඇත්තේ අදාල නීතිමය තත්ත්වය පිළිබඳ මතය අමාත්‍ය මණ්ඩලය සතු වන බැවින් නැවත එම මතය විමසිය යුත්තේ අමාත්‍ය මණ්ඩලය වෙතින් බව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් දන්වා ඇත. |

| | | |
|---|---|---|
| 3.3 නිර්දේශ අංක 09 - මංගත ලොතරැයිය නැවත ක්‍රියාත්මක කිරීම - 2021 | i. මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ විමර්ශන කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.<br><br>ii ඒ සඳහා අතිරේක තොරතුරු අවශ්‍ය වේ නම් ඒවා ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීම. | • මේ සම්බන්ධයෙන් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ නඩු ගොනු අංක ඒ.සී/2279/2024/බී-46 යටතේ නඩුවක් විභාග වෙමින් පවතින බව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය දන්වන ලදී |
| **04. 2022 හා 2023 වර්ෂවල විගණන වාර්තාවලින් අනාවරණය වන කරුණු හා වර්තමාන තත්ත්වය**<br><br>4.1. මහපොළ ශිෂ්‍යත්වය ලැබීමට සුදුසු සිසුන් තෝරා ගැනීම හා මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් කාලයේ වන ප්‍රමාදයන් අවම කිරීම | i. ශිෂ්‍ය සංඛ්‍යාව විචලනය වීම, ගෙවීම් කාලයේ වන ප්‍රමාදයන් පිළිබඳව අවධානය යොමුකර මහපොළ ගෙවීම් යාන්ත්‍රණය වේගවත් කිරීමට කටයුතු කිරීම හා ශිෂ්‍යත්ව ලැබීමට සුදුසුකම් ලැබූ සියලුම සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.<br><br>ii. රජයෙන් ගෙවිය යුතු මුදල් කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. | • අරමුදලේ පවතින මුදල් ප්‍රමාණය මත ශිෂ්‍යත්ව ප්‍රමාණය තීරණය වන අතර අරමුදල වර්ධනය වීමට සමානුපාතිකව ලබාදෙන ශිෂ්‍යත්ව ප්‍රමාණය වැඩි කිරීමට බලාපොරොත්තු වන බව දන්වා ඇත. එසේම ශිෂ්‍යත්ව ගෙවීමට අදාල යාන්ත්‍රණය වේගවත් කිරීම සඳහා තොරතුරු පද්ධතියක් හඳුන්වා දීමේ කටයුතු ආරම්භ කර ඇති බව දන්වා ඇත.<br>• 2022, 2023, 2024 සහ 2025 වර්ෂ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත. |
| 4.3. මහපොළ වෙළඳ ප්‍රදර්ශනය<br><br>අරමුදල් සපයා ගැනීමේ අරමුණින් 2023 දෙසැම්බර්13 සිට 14 දක්වා ජාඇල නගර සභා ක්‍රීඩාංගනයේ මහපොළ වෙළඳ ප්‍රදර්ශනයක් පවත්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ආදායම් ප්‍රකාශනනය අනුව වෙළඳ ප්‍රදර්ශනය මගින් රු.29,046,884ක අලාභයක් සිදුවී තිබිණි | i. වෝහාරික විගණනයක් සිදුකිරීමේ දී මෙම කරුණ ද ඇතුළත් කර මේ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීම. | • අරමුදල සම්බන්ධයෙන් සිදු කරනු ලබන වෝහාරික විගණනයේ විෂය පථයට මෙම කරුණු ද ඇතුලත් කර ඇති අතර වෝහාරික විගණනයට අදාල ලංසු ඇගයීමේ කටයුතු මේ වනවිටත් සිදු වෙමින් පවතින බව දන්වා ඇත. මීට අමතරව අපරාධ පරීක්ෂණ දෙපාර්මේන්තුවේ මූල්‍ය අපරාධ පරීක්ෂණ කාර්යාලයට ද ලිඛිත පැමිණිල්ලක් සිදු කර ඇති අතර අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසම මඟින් ද විමර්ශනයක් ආරම්භ කොට ඇති බව ද වැඩි දුරටත් දන්වා ඇත. |

| | | |
|---|---|---|
| 4.4. 2023 වර්ෂය තුළ කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවා ගැනීම<br><br>2023 වර්ෂය තුළ කොන්ත්‍රාත් පදනම මත වසර 02ක කාලයක් සඳහා වෙළඳ ප්‍රදර්ශණ සම්බන්ධීකරණ නිලධාරීන් 05 දෙනෙකු සහ කළමනාකරණ සහකාරවරු 03 දෙනෙක් සඳහා පත්වීම් ලබා දී තිබූ අතර එම නිලධාරීන්ගේ පත්වීම්වල නීත්‍යානුකුලභාවය, බඳවාගැනීමේ ක්‍රියාවලිය, ඔවුන්ගේ දීමනා තීරණය කිරීමේ පදනම, රාජකාරී පැවැරුම් කිරීම, රාජකාරී සඳහා වාර්තා කරන ස්ථාන, ආසන්නතම අධීක්ෂණ නිලධාරියා හා රාජකාරී ඉටුකිරීම සම්බන්ධයෙන් පිළිගත හැකි ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් වී නැති අතර, එම නිලධාරීන්ට 2023 ජූලි සිට 2024 පෙබරවාරි දක්වා වැටුප් හා දීමනා අරමුදල විසින් ගෙවා තිබුණි. | 1. වෝහාරික විගණනයක් සිදුකිරීමේ දී මෙම කරුණ ද ඇතුළත් කිරීම. | • අරමුදල සම්බන්ධයෙන් සිදු කරනු ලබන වෝහාරික විගණනයේ විෂය පථයට මෙම කරුණු ද ඇතුලත් කර ඇති අතර වෝහාරික විගණනයට අදාල ලංසු ඇගයීමේ කටයුතු මේ වනවිටත් සිදු වෙමින් පවතින බව දන්වා ඇත. |
| 4.5 මිල්ලෑව වත්ත ඉඩම<br><br>යෝජිත ජාත්‍යන්තර විශ්ව විද්‍යාල ගම්මානය ඉදිකිරීම සඳහා මිලට ගත් හොරණ මිල්ලෑව වත්ත ඉඩම සඳහා මහපොළ භාරකාර අරමුදල විසින් නාගරික සංවර්ධන අධිකාරියට රුපියල් මිලියන 200ක පමණ මුදලක් ගෙවා තිබුණි. මෙම ඉඩමේ අයිතිය පාදුක්ක ප්‍රාදේශීය ලේකම්ට ඇති බවත් නාගරික සංවර්ධන අධිකාරියට මේ ඉඩම සම්බන්ධයෙන් අයිතියක් නොමැති බවත්, එලෙස අයිතිය නිරවුල් නොවූ ඉඩමකට මහපොළ භාරකාර අරමුදල විසින් මුදල් ගෙවා ඇති බවත් කාරක සභාවට අනාවරණය විය | 1. වෝහාරික විගණනය සඳහා මෙම කරුණ ද ඇතුළත් කිරීම. | • අරමුදල සම්බන්ධයෙන් සිදු කරනු ලබන වෝහාරික විගණනයේ විෂය පථයට මෙම කරුණු ද ඇතුලත් කර ඇති අතර වෝහාරික විගණනයට අදාල ලංසු ඇගයීමේ කටයුතු මේ වනවිටත් සිදු වෙමින් පවතින බව දන්වා ඇත.<br><br>• භාරකාර මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය පරිදි මේ වන විට නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා ඇති අත්තිකාරම් මුදල සාධාරණ පොලියකුත් සමඟ නැවත ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

අනුර කුමාර දිසානායක
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය